සැ. යු. - (i) 2015.02.06 වැනි දින පළ වූ අංක 1901 දරන ගැසට් පත්‍රයේ III සහ IV(අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2010.06.28 වැනි දින සිට 2013.12.31 වැනි දින දක්වා වූ කාලසීමාවට අදාළ පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමලේඛනයක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,902 - 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2015.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 58 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 63 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 65 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 36

MOD/DEF/07/01/AVF/RET/347.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) තෙන්නකෝන් මුදියන්සේලාගේ තිලකරත්න, විපාරෙ (නි/6502)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

02 - 393

---

2015 අංක 37

MOD/DEF/07/01/AVF/RET/621.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2015 ජනවාරි මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) හපුගස්කුඹුරේ ගෙදර සිරිල් ප්‍රේමරත්න, ශ්‍රීලයුපොවුසේබ (නි/8499)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 339

2015 අංක 38

MOD/DEF/07/01/AVF/RET/589.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2012 ජූලි මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක - පොදු රාජකාරී) රාජමන්ත්‍රී ගෙදර උපුල් වසන්ත කුමාර, ශ්‍රීලසසබ (නි/6504)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

02 - 344

---

2015 අංක 39

MOD/DEF/07/01/AVF/RET/625.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන්මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 පෙබරවාරි මස 14 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් ජිනදාසගේ රාජරත්න වික්‍රම බණ්ඩාර, ශ්‍රීලපාහ (නි/5408)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් ස 04 වැනි දින,
කොළඹ දී ය.

02 - 345

2015 අංක 40

MOD/DEF/07/01/AVF/RET/345.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් අධිකාරී මුදියන්සේලාගේ චන්දන සරත් අධිකාරී, ශ්‍රීලංජාආබමු (නි/6814)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

02 - 392

---

2015 අංක 41

MOD/DEF/07/01/AVF/RET/554.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් පිටගල්දෙනියේ විදානෙලාගේ ප්‍රියන්ත මලල්පොල, ගරෙ (නි/6970)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 338

2015 අංක 42

MOD/DEF/07/01/AVF/RET/542.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් සේමසිංහ බණ්ඩාරලාගේ තිලකරත්න බණ්ඩාර, ගරෙ (නි/7748)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 336

---

2015 අංක 43

MOD/DEF/07/01/AVF/RET/550.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 අගෝස්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් දෙයාලගේ තුසිත පියකාන්ත, ශ්‍රීලයුසේබ (නි/7035)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 289

2015 අංක 44

MOD/DEF/07/01/AVF/RET/619.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් වරුෂගේ චමින්ද චින්තන අල්විස්, ඉසේබ (නි/5842)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 342

---

2015 අංක 45

MOD/DEF/AVF/07/01/RET/583.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් වග පේඩිගේ සමන් විකුම්සිරි, ගරෙ (නි/6811)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

02 - 333

2015 අංක 46

MOD/DEF/07/01/AVF/RET/582.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් තෙන්නකෝන් මුදියන්සේලාගේ රෝහන ප්‍රේමතිලක තෙන්නකෝන්, ශ්‍රීලංජාආබමු (නි/7634)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

02 - 335

---

2015 අංක 47

MOD/DEF/07/01/RET/584.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් හීං විදානෙලාගේ ගුණරත්න, ආර්එස්පී, විපාරෙ (නි/7733)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

02 - 340

2015 අංක 48

MOD/DEF/07/01/AVF/RET/628.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 නොවැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් පල්ලියගේ ලක්‍ෂමන් සිල්වා, ආර්එස්පී ශ්‍රීලකාහ (නි/7594)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

02 - 341

---

2015 අංක 49

MOD/DEF/07/01/AVF/RET/663.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ඉදප්පුලි ආරච්චිගේ සිරිල් ජයනෙත්ති, ශ්‍රීලංජාආබමු (නි/7368)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 337

---

2015 අංක 50

MOD/DEF/07/01/AVF/RET/612.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ගුණසිංහ රංජිත් ජයන්ත ප්‍රනාන්දු, ශ්‍රීලංජාආබමු (නි/6895)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 334

---

2015 අංක 51

MOD/DEF/07/01/AVF/RET/616.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් රොබොල් ලෙනවරාගේ ජයන්ත, ගැහේබ (නි/7512)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

02 - 343

2015 අංක 52

D/22/07/NY/446.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 ජනවාරි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (වි) පුන්‍ය ශාන්ත අතුකෝරාල, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0413

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 290

---

2015 අංක 53

MOD/DEF/10/03/PRO/05.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් වයිස් මාර්ෂල් නයිදූවා හැන්දි විජිත ගුණරත්න, (01371) පරිපාලන/රේජි 2014.09.30

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

02 - 394

---

2015 අංක 54

MOD/DEF/10/03/RES/41.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ස්කොඩ්රන් ලීඩර් පින්ගමගේ දොන් දිමුතු රංගන (02805) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 346

---

2015 අංක 55

MOD/DEF/10/03/PRO/01.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් එදිරිසූරිය මොහොට්ටිගේ තරංග ධනුෂ්ක ද සේරම් (02371) මෙහෙයුම් ගුවන් ශාඛාව - 2014.09.01
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් කදිර්වේල් මරුදමුත්තු මුරුගයියා ඉරෝෂන් (02220) පරිපාලන රෙජිමේන්තු ශාඛාව - 2014.09.13
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ෂමීල් නිරෝෂන් කිරිවැල්ල (02328) කාර්මික ඉංජිනේරු ශාඛාව - 2014.09.22
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් සමන්දර මරක්කල සංජීව සම්පත්ශ්‍රී (02341) පරිපාලන ශාඛාව - 2014.10.05
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් තඹදිය ලිලාන් චම්පික ජයසිංහ (02353) සැපයුම් ශාඛාව - 2014.12.31.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 348

2015 අංක 56

MOD/DEF/10/03/RES/39.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ඉල්ලා අස්වීමක්

2015 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රණසිංහ හේනයලාගේ රුක්මන් රණසිංහ (03170) - සැපයුම් ශාඛාව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 349

2015 අංක 57

MOD/DEF/10/03/RES/40.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම 2014 අගෝස්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ෆ්ලයින් ඔෆිසර් නුවන් සම්පත් ඒකනායක (03101) - නියමු පොදු රාජකාරි ශාඛාව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 347

# රජයේ නිවේදන

*මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/56/2014/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.02.06 වැනි දින සිට 2015.02.20 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.02.27 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඒ දරන කොට්ඨාසයේ 896 වෙළුමේ 178 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නාරාහේන්පිට, මොඩල් ෆාම් පාරේ පිහිටි කැබලි අංක 11 දරන ඉඩම් කොටසට ටී. එස්. ඊ. විජේසූරිය මානක තැන විසින් 1989.08.08 දින මැන සාදන ලද අංක 1469 දරන පිඹුරට ප්‍රකාර මායිම් : | 01. යූ. එල්. එස්. එන්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1995.02.17 දින අංක 18 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුර* : ලොට් 18<br>*නැගෙනහිර* : ලොට් 17<br>*දකුණ* : ලොට් 16<br>*බටහිර* : ලොට් 12<br>*ප්‍රමාණය* : අ. 00, රූ. 00, පර්. 15.50 | 02. බී. බී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1996.08.06 දින අංක 2962 දරන උකස් ඔප්පුව<br><br>03. ජී. සී. පී. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1998.08.10 දින අංක 641 දරන උකස් ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඒ දරන කොට්ඨාසයේ 896 වෙළුමේ 179 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නාරාහේන්පිට, මොඩල් ෆාම් පාරේ පිහිටි කැබලි අංක 17 දරන ඉඩම් කොටසට ටී. එස්. ඒ. විජේසූරිය මානක තැන විසින් 1989.08.08 දින මැන සාදන ලද අංක 1469 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : ලොට් 18<br>*නැගෙනහිර* : ලොට් 01<br>*දකුණ* : ලොට් 18<br>*බටහිර* : ලොට් 11<br>*ප්‍රමාණය* : අ. 00, රූ. 00, පර්. 03.08 | 01. යූ. එල්. එස්. එන්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1995.02.17 දින අංක 18 දරන විකුණුම් ඔප්පුව<br><br>02. බී. බී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1996.08.06 දින අංක 2962 දරන උකස් ඔප්පුව<br><br>03. ජී. සී. පී. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1998.08.10 දින අංක 641 දරන උකස් ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

02-303

---

**වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි 1951**

03 වැනි රෙගුලාසිය යටතේ නිවේදනය

වර්ෂ 1951 අප්‍රේල් මස 13 වැනි දින අංක 10234 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලදුව, 1951 ජූනි මස 29 දින අංක 10263 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1952 මැයි මස 02 වැනි දින අංක 10390 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1956 ජූනි මස 21 වැනි දින අංක 10943 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1966 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 14715 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, 1975 මාර්තු මස 07 වැනි අංක 154 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් ද, සංශෝධනය කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි පහත සඳහන් කෝවිල් සහ දේවාලවලට 2015 වර්ෂය තුළ දී කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් බලපැවැත්වෙන කාලය වශයෙන් උත්සවවාර මෙයින් නියම කරන ලදී.

| | | පටන්ගන්නා දිනය | අවසන්වන දිනය |
|---|---|---|---|
| 01. | කීරිමලෙයි නගුලේශ්වරන් පල්ලිය | 2015.02.04 | 2015.02.17 |
| 02. | කච්චතිවු ශාන්ත අන්තෝනි පල්ලිය | 2015.02.28 | 2015.03.01 |
| 03. | මරුතඩි පිල්ලයාර් කෝවිල්, මානිපායි | 2015.03.22 | 2015.04.15 |
| 04. | බුද්ධ විහාරය, නයිනාතිවු වෙසක් | 2015.05.03 | 2015.05.03 |
| 05. | බුද්ධ විහාරය, නයිනාතිවු පොසොන් | 2015.06.02 | 2015.06.02 |
| 06. | සිට්ටිවේරම් කන්නකෙ අම්මන් කෝවිල | 2015.06.01 | 2015.06.14 |
| 07. | නයිනාතීවු නාගපූෂණිඅම්මන් කෝවිල | 2015.06.17 | 2015.07.05 |
| 08. | වෙට්රිලෙක්කේණී පුල්ලාවෙලි පුනිද සෙපස්තියර් දේවාලය | 2015.07.03 | 2015.07.05 |
| 09. | කන්දසාමි කෝවිල, මාවඩ්ඩපුරම් | 2015.07.21 | 2015.08.14 |
| 10. | ශාන්ත සෙපමාලයි මාතා දේවාලය, සින්නමඩු | 2015.07.27 | 2015.08.05 |
| 11. | කීරිමලෙයි නගුලේශ්වරන් පල්ලිය | 2015.08.14 | 2015.08.14 |
| 12. | සෙල්වසන්නිදිකෝවිල්, තොන්ඩමානාර | 2015.08.18 | 2015.08.29 |
| 13. | ශ්‍රී තුර්ගා දේවි දේවස්ථානය, තෙල්ලිප්පලෙයි | 2015.08.17 | 2015.08.28 |
| 14. | සින්තාන්තිරයි මාතා දේවස්ථානය, සාඩ්ඩි, වේලනයි | 2015.09.10 | 2015.09.19 |
| 15. | ශ්‍රී වල්ලිපුර ආල්වාර් කෝවිල්, තුන්නාලයි | 2015.09.12 | 2015.09.27 |
| 16. | මට්ටුවිල් පන්රිත්තලච්චි කන්නකෙඅම්මන් කෝවිල | 2015.12.17 | 2015.12.25 |

රූබිනි වරතලිංගම්,
අතිරේක දිසාපති,
*යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.*

වර්ෂ 2015 ක් වූ ජනවාරි මස 26 වැනි දින,
යාපනය දිසාපති කාර්යාලයේ දී ය.

02-448

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන්වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්න ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.12.21 දිනැති අංක 124 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය මහනුවර පිහිටි 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද ලියාපදිංචි අංක PV4822 දරන සමාගමක් වන මිල්කි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති බැවින් ද,

තව ද ණයට ගන්නා විසින් පහත සඳහන් දේපල සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 124 දරන බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති හෙයින් ද,

තව ද, වර්ෂ 2014 නොවැම්බර් මස 30 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් පන් මිලියන හත් ලක්ෂ අසූ හත් දහස් පන්සිය තිස් හතරයි ශත විසි හත (රු. 57,87,534.27) ක මුදලක් අයවිය යුතුව හා ණයට පවතින් බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් පන් මිලියන හත් ලක්ෂ අසූහත් දහස් පන්සිය තිස් හතරයි ශත විසි හත (රු. 57,87,534.27) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 124 දරන බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 124 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදලවන රුපියල් හාර මිලියන තුන් ලක්ෂ හතලිස් හත් දහස් අටසියය (රු. 43,47,800) ක මුදල මත වසරකට සියයට විසි තුනක (23%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තිය අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නන් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

### ඉහත සඳහන් උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඩුපිටපත්තුවේ අතල ගමෙහි පිහිටි බලයලත් මානක ඒ. ඒ. පද්මදාස

විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 3711 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණුකර ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 37.02) වන පරෙන්උඩතවත්ත, සූරියගෙවත්ත හ පරෙන්යටහෙඹිවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම්වල එකී ලොට් 1 ඉහත කී පිඹුර අනුව උතුරට : පාරෙන් සහ පිඹුරු අංක 1093/K/1 හි ලොට් 10 න් ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 1093/K/1 හි ලොට් 10 න් ද, දකුණට : පිඹුරු අංක 1595 හි ලොට් 2න් සහ පිඹුරු අංක1093/K/1 හි ලොට් 14න් සහ බටහිරට : පිඹුරු අංක 1093/K/1හි ලොට් 14න් ද මායිම් වන අතර එහි පිහිටි සියලු දේද සමග වේ. එකී පිඹුරු අංක 1595 හි ලොට් 17 මතින් සහ ඒ හරහා වන මාර්ග අයිතිය ද ඇතුළුව වේ.

ඉහත කී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමක් වේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඩුපිටපත්තුවේ අතල ගමෙහි පිහිටි බලයලත් මානක එම්. එච්. පී. සිරිවර්ධන විසින් සාදන ලද 1993.01.29 දිනැති පිඹුරු අංක 1093/K/1 හි ලොට් 1 ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 37.4) වන පරෙන්උඩතවත්ත, සූරියගෙවත්ත සහ පරෙන්යටහෙඹිවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම්වල එකී ලොට් 1 ඉහත කී පිඹුර අනුව උතුරට : පිඹුරු අංක 1595හි ලොට් 10න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1595හි ලොට් 2න් ද, දකුණට : පිඹුරු අංක 1595 හි ලොට් 14න් ද, බටහිරට : පාරක් සඳහා වෙන්කර ඇති ඉඩමෙන් ද මායිම් වන අතර එහි පිහිටි සියලු දේ ද සමග වේ. (කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E1121/201 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත) එකී පිඹුරු අංක 1595 හි ලොට් 17 මතින් සහ ඒ හරහා වන මර්ග අයිතියද ඇතුළුව වේ.

2. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඩුපිටපත්තුවේ අතල ගමෙහි පිහිටි බලයලත් මානක එම්. එච්. පී. සිරිවර්ධන විසින් සාදන ලද 1993.01.29 දිනැති පිඹුරු අංක 1093/K/1 හි ලොට් 1 ලෙස ලකුණු කර ඇති (මායිම් තහවුරු කිරීම බලයලත් මානක කේ. ඒ. ටී. විජයවර්ධන විසින් 2012.11.08 වන දින සිදුකර ඇත) ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 37.4) වන පරෙන්උඩතවත්ත, සූරියගෙවත්ත සහ පරෙන්යටහෙඹිවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම්වල එකී ලොට් 1 ඉහත කී පිඹුර අනුව උතුරට : පිඹුරු අංක 1595හි ලොට් 13න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1595හි ලොට් 2න් ද, දකුණට : පිඹුරු අංක 1595හි ලොට් 16න් සහ බටහිරට : පාරක් සඳහා වෙන්කර ඇති ඉඩෙන් ද මායිම් වන අතර එහි පිහිටි සියලු දේද සමග වේ. (කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 999/244 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත).

ඉහත කී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමක් වේ :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඩුපිටපත්තුවේ අතල ගමෙහි පිහිටි බලයලත් මානක ඩී. ලියනගේ විසින් සාදන ලද 1965.01.15 දිනැති පිඹුරු අංක 1595A හි ලොට් 14 ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 37.4) වන පරෙන්උඩතවත්ත, සූරියගෙවත්ත සහ පරෙන්යටහෙඹිවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම්වල එකී ලොට් 14 ඉහත කී පිඹුරු අනුව උතුරට : පිඹුරු අංක 1595හි ලොට් 13න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1595හි ලොට් 2 න් ද, දකුණට : පිඹුරු අංක 1595හි ලොට් 16න් සහ බටහිරට : පාරක් සඳහා වෙන්කර ඇති ඉඩ-ලොට් 17න් ද මායිම් වන අතර එහි පිහිටි සියලු දේද සමග වේ. (කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E999/14 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.)

ඉහත කී ඉඩම සහ පරිශ්‍රය මත පිහිටි සියලු ගොඩනැගිලි, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිකිරීම්, ඇමුණුම් සහ සේවා ද සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

02-429

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මතකර ගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණතුංග විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.05.29 දිනැති අංක 2616 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය හිඟුරක්ගොඩ, පොලොන්නරුවේ පිහිටි 1995.03.27 දිනැති සහතික අංක NCP/HP12/648 දරන සහතිකය යටතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇති සමන් ෂූ පැලස් යන නාමය විලාසය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන දෙලත් ප්‍රගීත් ඉන්ද්‍රජිත් ද සොයිසා සහ ප්‍රන්සිස්කු බඳුගේ බන්දුවතී විමලසේකර යන අය (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද;

තවද ණයට ගන්නා විසින් පහත සඳහන් දේපල සහ පරිශ්‍රය සඳහා වන සිය බදු අයිතිවාසිකම් හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 2616 දරන බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති හෙයින් ද;

තවද වර්ෂ 2014 ඔක්තොබර් මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් පන් මිලියන හත් ලක්ෂ අනූ දෙදහස් හාරසිය තිස් දෙකයි ශත දහතුන (රු. 57,92,432.13) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින් බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී රුපියල් පන් මිලියන හත්ලක්ෂ අනූ දෙදහස් හාරසිය තිස් දෙකයි ශත දහතුන (රු. 57,92,432.13) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2014 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 2616 දරන බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 2616 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් පන් මිලියන තුන්ලක්ෂ අටදහස් තුන්සිය දාහතක (රු. 53,08,317) මුදල මත වසරකට සියයට දාහතයි දශම හත (17.7%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තිය අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය සඳහා වන බදු අයිතිවාසිකම් හිමිකම් සහ

බලපුළුවන්කාරකම් බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟුරක්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ ගමෙහි පිහිටි මිනින්දෝරු ජනරාල් විසින් සාදන ලද සහ ඔහු සතුව පවතින පිඹුරු අංක 2හි I. S. P. 07 දරන අතිරේකයේ ලොට් 422 යනුවෙන් ලකුණු කරන ලද හිඟුරක්ගොඩ බසාර් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 423න් ද, දකුණට : පාරක් සඳහා වෙන් කර ඇති ඉඩමෙන් ද සහ බටහිරට : ලොට් අංක 421න් ද මායිම් වන අතර මෙය ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හතයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 2.70) වන අතර එහි පිහිටි ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි ඇතුළු සියලු දේද සමග වේ.

මෑතකදී කරන ලද මිනින්දෝරු පිඹුරකට අනුව මෙම ඉඩම පහත ආකාරයෙන් විස්තර කර ඇත :

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඟුරක්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ ගමෙහි පිහිටි මිනින්දෝරු ජනරාල් විසින් සාදන ලද සහ ඔහු සතුව පවතින I. S. P. පිඹුරු අංක 07හි අංක 2 දරන අතිරේකයේ ලොට් 422 යනුවෙන් ලකුණු කර ඇති බලයලත් මානක පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද පිඹුරු අංක 2012/PO/102හි ලොට් 01 ලෙස දක්වා ඇති හිඟුරක්ගොඩ බසාර් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස උතුරට : ප්‍රධාන පාරෙන් ද, නැගෙනහිරට : I. S. P. පිඹුරු අංක 07හි ලොට් 423න් ද, දකුණට : ප්‍රවේශය සඳහා ඇති ඉඩමෙන් ද සහ බටහිරට : I. S. P. පිඹුරු අංක 07හි ලොට් 421න් ද මායිම් වන අතර මෙය ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හතයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 2.70) වන අතර එහි පිහිටි ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි ඇතුළු සියළු දේ ද වේ.

අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී.

02-430

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින්, 1984හි අංක 29 දරන පනතින් හා 1994හි අංක 10 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනාව

ණය අංකය : 1/503/02/1867/POI/594, 52/500/02/176/GMA/577.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. එස්. එස්. කේ. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2012.04.27 දින හා අංක 809 දරන සහ 2012.11.02 දිනැති අංක 924 දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 10, මරදාන, බද්දේගම විමලවංශ නාහිමි මාවත, අංක 53/3හි පදිංචි සමන් පුෂ්ප කුමාර අබේගුණරත්න සහ දේවිකා අබේගුණරත්න හෙවත් දේවිකා සුබ්‍රමනියම් යන අයවළුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, 2014.09.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අනූහය ලක්ෂ තුන්දහස් හත්සිය හතලිස් හයයි ශත අනූහතක් (රු. 96,03,746.97) සහ විසි ලක්ෂ විසි දෙදහස් තුන්සිය හතලිස් හතයි ශත හැත්තෑ හතක (රු. 20,22,347.77) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 809 සහ 924 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හාරදහස් එකසිය අනූනවයක් (රු. 4,189) සහ එක්දහස් පහයි ශත පනස් අටක් (රු. 1,005.58) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ (මාකොළ උප කාර්යාලය) බියගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ මාකොළ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාකොළ උතුර ඥානමෝලි මාවතේ වරිපනම් අංක 15/2හි පිහිටි "දඹුගහවත්ත හෙවත් අළුබෝගහවත්ත " නමැති ඉඩමට 1989.07.23 දින බලයලත් මිනින්දෝරු ආර්. හෙට්ටිආරච්චි මහතා විසින් මැන සකසන ලද අංක 119/1989 දරන මිණුම් පිඹුරේ දැක්වෙන කැබලි අංක 1 ලෙස බෙදා වෙන්කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12ක් වූ බිම් කොටස හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක C961/240 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

තවද ඉහත දැක්වෙන අංක 119/1989 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 4 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක C961/243 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

ඩබ්. ජේ. කේ. ගීගනගේ මෙනෙවිය,
*වැඩබලන සාමාන්‍යාධිකාරිණී.*

2015 ජනවාරි මස 27 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

02-414

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ගාල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.01.07 වැනි දින විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, උපුලි ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් ද, පුවක්දන්ඩාවේ ලොකුආචාරිගේ සෝමපාල උකස්කරු වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද 2010 ජූලි මස 07 දිනැති අංක 1965 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

1. වර්ෂ 2014 ඔක්තෝබර් මස 13 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හතලිස් දෙමිලියන පනස් පන් දහස් හාරසිය අනූ එකයි ශත තිහ (රු. 42,055,491.30) ක මුදල සහ 2014.10.14 වැනි දින සිට රුපියල් විසිහතර මිලියන පන් ලක්ෂ හැත්තෑ දහස් නවසිය දහයයි ශත හතලිස් නවය (රු. 24,570,910.49) ක මුදල මත වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් පොළිය ද, සහ

2. වර්ෂ 2014 ඔක්තෝබර් මස 13 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහඅට මිලියන පන් ලක්ෂ පනස් නව දහස් හතයි ශත දහ නවය (රු. 18,559,007.19) ක මුදල සහ 2014.10.14 වන දින සිට රුපියල් දස මිලියන හාරලක්ෂ පහළොස් දහස් පන්සිය හැත්තෑවයි ශත තිහ (රු. 10,415,570.30) ක මුදල මත වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් පොළිය ද,

එකී අංක 1965 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත්,

එකී අංක 1965 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැට මිලියන හයලක්ෂ දාහතර දහස් හාරසිය අනූඅටයි ශත හතලිස් නවය (රු. 60,614,498.49) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද එතෙක් ගෙවන ලද ගෙවීම් (යමක් වේනොත්) එය අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) හි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාළු දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ සහ ගාළු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ක්‍රිප්ස් පාරේ වරිපනම් අංක 47 දරන ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මොල්ලේගෙදරවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. ඒ. බීබී විසින් මැන සාදන ලද අංක 1468 සහ 1958 සැප්තැම්බර් මස 20 දිනැති සැලැස්මේ ලොට් 1C වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : තල්ගහවත්ත, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 1බී සහ ලොට් 1ඊ, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1ඩී4 සහ 1ඩී1 දරන ඉඩම් කැබලි යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස්පහයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 2, පර්. 35.50) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි "කුසුමලා" නමැති නිවස සහ පරිශ්‍රය සහ ගහකොළ පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ. ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A664/224හි ලියාපදිංචි කර ඇත.

මෑතදී සාදන ලද මැනුමක් අනුව එකී අංක 1468 සැලැස්ම ලොට් 1සී දරන බිම් කැබැල්ල පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත :

දකුණු පළාතේ, ගාළු දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ සහ ගාළු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ක්‍රිප්ස් පාරේ වරිපනම් අංක 47 දරන ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මොල්ලේගෙදරවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එන්. වික්‍රමසේකර විසින් මැන සාදන ලද අංක 674 සහ 2000 පෙබරවාරි මස 24 දිනැති සැලැස්මේ ලොට් A වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : තල්ගහවත්ත, නැගෙනහිරට : ලොට් 1බී සහ පාර ද, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : ලොට් 1ඩී1 සහ 1ඩී4 සහ හැගොඩ රාළගේ වත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසි හතයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 2, පර්. 27.50) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි "කුසුමලා " නමැති නිවස සහ පරිශ්‍රය සහ ගහකොළ, පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ.

පහත ඉඩම මත මාර්ග අයිතිය ද සමගින් වේ.

දකුණු පළාතේ, ගාළු දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ සහ ගාළු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ක්‍රිප්ස් පාරේ ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මොල්ලේගෙදරවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. ඒ. බීබී විසින් මැන සාදන ලද අංක 1468 සහ 1958 සැප්තැම්බර් මස 20 දිනැති සැලැස්මේ ලොට් 1E වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට සහ ඊසානදිගට : මෙම ඉඩමේම ලොට් 1බී, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 1ඒ, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1සී යන මායිම් තුළ පිහිටි පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 08) ක් විශාල ඉඩම. ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 561/108හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරන්ත රොද්‍රිගු,
කළමනාකරු - ණය අයකර ගැනීම්.

02-441

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1335562.
තරිඳු ජනක ප්‍රතාපසිංහ සහ තිප්පල ගමගේ ස්වර්ණලතා ගුණවර්ධන.

2014 දෙසැම්බර් මස 19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. සී. කේ. පෙරේරා විසින් 2012 සැප්තැම්බර් මස 21 වැනි දින සහතික කරන ලද අංක 16 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද

බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තරිඳු ජනක ප්‍රතාපසිංහ සහ තිප්පල ගමගේ ස්වර්ණලතා ගුණවර්ධන ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි තිස්එක්ලක්ෂ අනූහයදහස් හත්සිය තිස්අටයි ශත අනූහයක (රු. 13,196,738.96) මුදලක් 2014 ඔක්තෝබර් 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි තිස්එක්ලක්ෂ අනූහයදහස් හත්සිය තිස්අටයි ශත අනූහයක (රු 1,31,96,738.96) මුදල අයකර ගැනීම සහ 2014 ඔක්තෝබර් 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,21,04,400ක මුදල මත 18% වැඩිවූ පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා අඩුකොට එකී අංක 16 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හා උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ අංක 182 දරන ස්ථානයේ 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොඩම්පොල බටහිර ග්‍රාම නිලධාරී වසමේ වැල්ලබඩ පත්තුවේ දොඩම්පහල ගමේ පිහිටි පටබැඳිගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 1999 ඔක්තෝබර් මස 10 වැනි දින මැන සාදන ලද අංක 1429 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : දික්වැල්ල - තංගල්ල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : සුළු පාර ද, දකුණට : කජ්ජුගහවත්ත ද සහ බස්නාහිරට : ලොකුමානගේ වත්තෙන් ද මායිම් එකී අංක 1429 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.2023 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරූ B647/207 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම් කැබැල්ල සඳහා වඩා මෑතකදී බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2009 නොවැම්බර් මස 08 වැනි දින මැන සාදන ලද අංක 2752 ට අනුව පහත සඳහන් පරිදි විස්තර වේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, දොඩම්පහල බටහිර ග්‍රාම නිලධාරී වසමේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම්පහල ගමේ පිහිටි පටබැඳිගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2009 නොවැම්බර් මස 08 දින මැන සාදන ද අංක 2752 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : දික්වැල්ල-තංගල්ල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : ඒරුප්ප සහ කජුගහවත්ත ද, දකුණට : කජ්ජුගහවත්ත ද සහ බස්නාහිරට : ලොකුමානගේ වත්තනේ ද මායිම් වූ එකී අංක 2752 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.2023 විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

රංජනී ගමගේ මිය,<br>
සමාගම් ලේකම්.

02-371

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්ති යටතේ කරනු ලබන දැනුම්දීම

2014.05.06 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2011.09.22 දිනැති අංක 4369 දරන උකස් බැඳුම්කරය අනුව පළමු ණය මුදල සඳහා 2014.03.25 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් තුන්කෝටි දහඅට ලක්ෂ අසූ අටදහස් අටසිය අසූවක් පමණි) (රු. 31,888,880) මුදල මත වසරකට සියයට නවයයි දශම පහක (9.5%) බැගින් පොලිය ද, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩබ්. ඒ. එස්. පී. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2012.08.10 දිනැති අංක 200 දරන උකස් බැඳුම්කරය අනුව 2014.03.25 වැනි දින තෙක් දෙවන ණය මුදල සඳහා රුපියල් දෙකෝටි තිස්තුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විස්සක් පමණි (රු. 23,333,320) වර්ෂයකට සියයට දහහතරක (14%) බැගින් තවදුරටත් පොලිය ද ණය දෙකෙහිම මුල් මුදල රුපියල් හයකෝටි හතලිස්පන් ලක්ෂ පනස්හත් දහස් දෙසිය හැත්තෑදෙකයි ශත තිස් හයක් පමණි (රු. 64,557,272.36) 2014.03.25 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සීදුව ලියනගේමුල්ල අංක 04හි පිහිටි සීමාසහිත එස්. එස්. ෆයිබර් ෆැමිලි (පුද්.) සමාගම වෙතින් අයවිය යුතුව ඇත. (ප්‍රේමතිරත්න කරුණාමුනි සුනිල් ද සිල්වා නමින් ද, හඳුන්වන කරුණාමුනි සුනිල් ද සිල්වා ප්‍රේමතිරත්න රත්නාවලී ශ්‍රීමා ප්‍රේමතිරත්න මිය, කරුණාමුනි විනෝදි ද සිල්වා ප්‍රේමතිරත්න මිය සහ දොන් බන්දුල විජේමාන්න මහත්වරු අධ්‍යක්ෂවරු වේ.

2. 2014.03.25 දිනැති අංක 4369 සහ 200 දරන එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හයකෝටි හත්ලිස් පන් ලක්ෂ පනස් හත් දහස් දෙසීය හැත්තෑ දෙකයි ශත තිස් හයක් පමණි (රු. 64,557,272.36) මුදල් සමග 2014.03.25 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති ආදළ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව විහාර මාවතේ, අංක 50/3 හි ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාහට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කඩවත අධිශ්‍රේණි ශාඛාවේ ශාඛා කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටියන කෝරළේ, කටුගම්පලහත්පත්තුවේ, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අකරවත්ත 1401 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ අකරවත්ත පිහිටි ලෝලුගහමුලවත්ත අඹගහමුලවත්ත සහ

ඇහැලගහමුල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද 2011 අගෝස්තු මස 17 දිනැති අංක 2028 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ආර්. එම්. සෝමපාල සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, කුඩාවැව ද, නැගෙනහිරට : ප්‍රසිද්ධ නොතාරිස් වී. සිට්සබේසන් විසින් සාදන ලද 1991 නොවැම්බර් 18 සහ 23 දිනැති අංක 1130 දරන පිඹුරෙහි ලොට් 1 හි බෙදූ කොටස (කුඹුර), සහ එස්. ඒ. කරුණාරත්න සහ වෙනත් අයට උරුමකම් කියන කුඹුර ද, දකුණට : ආර්. එච්. හේමපාල සිරිල් සහ වෙනත් අය උරුමකම් කියන කුඹුර ද, ආර්. එම්. විජේරත්න උරුමකම් කියන කුඹුර සහ ජී. එල්. සී පතිරණ සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : ආර්. එම්. රන්කිරි උරුමකම් කියන ඉඩම ද, සී. එච්. ගුණදාස උරුමකම් කියන ඉඩම සහ පාර (මහා මාර්ගය) ද මායිම් ව එකී අංක 2028 දරන පිඹුර අනුව අක්කර හයයි පර්චස් බිංදුවයි දශම පහක් (අ. 6, රූ. 0, පර්. 0.5) හෙවත් හෙක්ටයාර් 2.4293ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැඩෙන ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියළු දේ ද අයත් වන අතර මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J202/50හි ලියාපදිංචි කර ඇත.

### පහත සඳහන් දෑ අඩංගු ඉහත සඳහන් දෙවැනි උපලේඛනය

පළමු උපලේඛනයේ පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රයට සම්බන්ධ කර ඇති පහත සඳහන් දෑ අයත් වන යන්ත්‍රාගාරය සහ යන්ත්‍රසූත්‍ර ආදී සියල්ල ද වේ :-

| *Description* | *Quantity* | *Serial No.* | *Model No.* | *Year of Manufacture* | *Country of Manufacture* |
|---|---|---|---|---|---|
| Verville Three Bin Bales Machine | 1 | LR 1191-1 | SSF91 | 2010 | Canada |
| Grow Bag Machine | 1 | SL 901 | SSF95 | 2009 | Sri Lanka |
| 10Kg Bale Machine | 1 | SL 2011 | SSF 101 | 2009 | Sri Lanka |
| Teco Crusher | 1 | JK 2009 | JP86 | 2009 | Japan |
| Dryer | 1 | JK 2110 | JPK93 | 2009 | Japan |
| 30,000KG Avery Weighbridge | 1 | UK2001 | UK8501 | 2004 | UK |
| Grow Bag Baling Machine | 1 | 0081852 | MH712 | 2011 | Assembled in Sri Lanka |
| Fiber Cutter Machine | 1 | 31053700 | MH912 | 2011 | Assembled in Sri Lanka |
| Fiber Cutter Machine | 1 | 32545100 | MH912 | 2011 | Assembled in Sri Lanka |
| 5KG Bailing Machine | 1 | 00074618 | MH710 | 2011 | Assembled in Sri Lanka |
| Grow Bag Bailing Machine | 1 | 00980657 | MH712 | 2011 | Assembled in Sri Lanka |
| 3 in 1 System Bailing Press Machine | 1 | 3YBC441 | MH708 | 2011 | Assembled in Sri Lanka |
| Fiber Dust Cutter Machine | 1 | 31535290 | MH815 | 2011 | Assembled in Sri Lanka |

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. කේ. ජයසුන්දර,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
කඩවත අධිශ්‍රේණි ශාඛාව.

02-431

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.